හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 06 කට අදාළ ණයහිමි ශේෂය රු.7,075,278 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	2025 වර්ෂයේ ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු. රු.7,185,711 ක් වූ ආදායම් වියදම් විෂයන් 05ක් අය/වැය විෂයය වරදවා ගිණුම්ගත කර තිබුණි.	-එම-	-එම-
(ඇ)	ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී දරන ලද රු.2,174,891 ක් වූ ගොඩනැගිලි අලුත්වැඩියා වියදම වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.	-එම-	-එම-
(ඈ)	සමාලෝචිත වර්ෂය තුල ජංගම වෙළඳ කුටි ඉදි කිරීම සඳහා වැය කර තිබූ රු.337,500 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි.	-එම-	-එම-
(ඉ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙවූ රථවාහන රක්ෂණාවරණ වියදම් රු.110,770 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් සේ ගිණුම්ගත කර තිබුණි.	-එම-	-එම-
(ඊ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.98,191 ක් වූ වියදම් 18 ක් සඳහා ණය හිමි ප්‍රතිපාදන සිදු කර නොතිබුණි.	2025 වර්ෂයේ ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.

(උ)	සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් රු.77,000 ක් වූ ඇඟිලි සලකුණු යන්ත්‍රයේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.	2025 වර්ෂයේ ගිණුම පිළියෙල කිරිමේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව.	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.

1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාලන ගිණුම් 05ක ශේෂයන්ගේ එකතුව රු.89,990,122ක් වූ අතර උපයෝගි ලේඛන අනුව එකතුව රු.88,811,491ක් වුයෙන් රු.1,178,631ක වෙනසක් විය.	2025 වර්ෂයේ ගිණුම පිළියෙල කිරිමේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව.	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත 24 වගන්තිය	සභාව විසින් සීමා ලකුණු කර පාරවල් සහ පටු මංමාවත් පිළිබඳ නාම ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන නොතිබුණි.	මාර්ග ඉන්වෙන්ට්‍රියක් සකස් කර යාවත්කාලීන කරමින් පවතින බව.	පාරවල් සහ පටු මංමාවත් පිළිබඳ නාම ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගත යුතුය.
(ආ)	1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193	අයවැය විචලනයන් හා ඊට අදාළ හේතු දැක්වෙන ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 193 අනුව සකස් කර ඉදිරිපත් කරන බව.	මූල්‍ය ප්‍රකාශන සමඟ සියළු තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
(i)	මුදල් රෙගුලාසි 104 (4)	2022 දෙසැම්බර් 09 දින අනතුරට පත්වී තිබුණු කැබ් රථය සම්බන්ධයෙන් අනතුර සිදු වී වසර 2කට වැඩි කාලයක් ගත වී තිබුණද, වගකිව යුත්තන් නිශ්චය කර අලාභ හානි පියවා ගැනීම හා අදාළ නිර්දේශ ඇතුලත් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම කර නොතිබුණි.	මෙම අනතුර සම්න්ධයෙන් අවසන් පරීක්ෂණය පිළියෙල කිරිම සඳහා මුදල් රෙගුලාසි 104 (4) අනුව අවසන් පරීක්ෂණය සිදු කර ඇති අතර එම පරීක්ෂණයේ නියෝග මෙතෙක් ලැබී නොමැති බව හා අදාල නියෝගය කඩිනමින් ලබාගෙන අලාභ හානි පියවා ගැනීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය
(ii)	මුදල් රෙගුලාසි 371	සභාව විසින් ඉකුත් වර්ෂවලදී ලබා දුන් රු.433,124ක් සහ සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණු රු.142,900 ක අත්තිකාරම් පියවා නොතිබුණි.	පියවීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(iii)	මුදල් රෙගුලාසි 571 (i)	තැන්පත් කර වර්ෂ 02 ක් කල් ඉකුත් වු පොදු තැන්පත් ශේෂ වටිනාකම රු. 407,356 ක් නියාදනය කර නොතිබුණි.	වසර 02 ක් ඉක්මවූ තැන්පතු ඉදිරියේදි ආදායමට ගැනීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 14,931,456 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 14,251,679 විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්ත මේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් බදු	3,354,902	5,844,369	6,192,283	1,385,499	3,006,119	3,620,519	4,468,621	884,718
(ii)	කුලී	5,527,664	6,082,648	5,630,723	1,516,334	4,206,100	5,247,537	4,914,874	1,369,782
(iii)	බලපත්‍ර ගාස්තු	847,100	1,453,925	1,453,925	60,509	837,100	2,331,937	2,369,137	60,509
(iv)	වෙනත් ආදායම්	21,694,752	21,723,147	21,571,442	13,489,144	6,761,750	11,025,736	10,785,366	4,204,592
	එකතුව	31,424,418	35,104,089	34,848,373	16,451,486	14,811,069	22,225,729	22,537,998	6,519,601

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**වරිපනම් හා බදු** සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු.565,291 ක් වූ වරිපනම් බදු වලින් වර්ෂය තුළ රු. 380,195ක් අයකර තිබුණි. එය බිල්කළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 67 ක් විය.	බිල්කල වරිපනම් ආදායම් අයකර ගැනීමට අවශ්‍යය කටයුතු කර බව.	පනතේ විධි විධාන අනුව හිඟහිටි ආදායම් අය කරගත යුතුය.
(ආ)	**කුලී** වසර 04 කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි කඩකුලී රු.377,490 ක් සමාලෝචිත වර්ෂයේදීද අයකරගෙන නොතිබුණි.	කඩ කාමර කිහිපයක ඉඩම් අයිතිය නිරවුල් කර ගැනීමෙන් අනතුරුව හිඟය අයකර ගැනීමට කටයුතු කරමි. එමෙන්ම කඩකුලී සඳහා අදාල අයකිරීම් අයකර ගැනීමට නීතිමය කටයුතු ආරම්භ කරන බව.	ගිවිසුම් අනුව හිඟහිටි ආදායම් අය කරගත යුතුය.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.6,042,714ක් හා මුද්දර ගාස්තු රු.23,549,292 ක් ගෙන්වාගෙන නොතිබුණි.	ඉදිරියේදී හිඟ ආදායම් නිරාකරණය කර ගැනීමට අපේක්ෂා කරන බව.	හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සභාව විසින් ජල යෝජනා ක්‍රම 06ක් යටතේ පවුල් 896 ක් සඳහා ජල අවශ්‍යතා සපුරාලමින් ආදායම් උපයන අතර ඉන් ජල යෝජනා ක්‍රම 03ක් සම්බන්ධයෙන් සිදු කල ජල සාම්පල පරීක්ෂාවේ දී පානීය ජලය ලෙස යොදා ගැනීම නුසුදුසු බව හල්දුම්මුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් 2024 දෙසැම්බර් 19 දින වාර්තා කර තිබුණි. මෙම ජලය පානයට සුදුසු තත්ත්වයට පත් කර ලබා දීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබූ අතර ඉතිරි ජල යෝජනා ක්‍රමයන් 03හි ජල සාම්පල පරීක්ෂාවට ලක් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.	ජල ව්‍යාපෘති දෙකක ජලය පිරිසිදු කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර ඉතිරි ව්‍යාපෘතීන්වල ජලය පිරිසිදු කිරීමට අවශ්‍යය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	ජනතාවගේ පිරිසිදු පානීය ජල අවශ්‍යතාවය කඩිනමින් සම්පූර්ණ කළ යුතුය.
(ආ)	අයවැය ලේඛණය මඟින් ප්‍රතිපාදන වෙන් නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු තුළ රු. 3,856,644 ක ශේෂයක් රඳවා තිබුණි.	ඉදිරියේදි පත්වන සභාවේ සභා තීරණ මත මෙම ස්ථාවර තැන්පතු මුදල් පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති බලතල ඉටු කර ගැනීම සඳහා යොදා ගැනීමට කටයුතු කරන බව.	සභා අරමුදල් ඵලදායී ලෙස යොදා ගත යුතුය.

3.2 අනාර්ථික ගණුදෙනු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2015 මාර්තු 31 දින සභා අරමුදල් යටතේ බෝක්කුවක් ඉදිකිරීමට සහ පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘතියකට පිළිවෙලින් රු.10,000 ක් සහ රු.100,000 ක අත්තිකාරම් කිතුලගහඅරාව ග්‍රාමීය සංවිධානයට ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ද කර්මාන්ත ඉටු කර නොතිබූ අතර, අත්තිකාරම්ද පියවා නොතිබුණි.	කිතුල්ගහඅරාව ග්‍රාම සංවර්ධන සමිතිය දැනුවත් කර ඇති බව.	අත්තිකාරම් අප්‍රමාදව පියවා ගත යුතුය

(ආ)	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් උඩ දියලුම ඇල්ල ආශ්‍රිත ඉඩම මැනුම් කටයුතු කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් රු.187,000 ක් වැය කර තිබුණද ඉඩම පවරා ගෙන නොතිබුණි.	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ ඌව පළාත් සංචාරක අමාත්‍යාංශය සභාව දැනුවත් කර ඇති අතර ඉදිරියේදි ගැටළුව නිරාකරණය කර ගැනීමට කටයුතු කරන බව.	ඉඩම පවරාගෙන සංවර්ධන කටයුතු සිදු කළ යුතුය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1982 නොවැම්බර් 08 දින ප්‍රාදේශීය සභාවේ කොස්ලන්ද උප කාර්යාලයට අයත් නිවාසයක් බදු ගිවිසුමකට එළඹ ප්‍රාදේශීය සභාවේ සේවකයකුට ලබා දී තිබුණු අතර, 1984 ජනවාරි 01 දින එම නිලධාරියා විශ්‍රාම ගොස් තිබුණද අදාළ නිවාසය ප්‍රාදේශීය සභාවට නැවත පවරාගෙන නොතිබුණි.	දීර්ඝ කාලයක් තිස්සේ පවතින ගැටළුවක් බැවින් ඉදිරියේදි පත්වන සභාවේ සභා තීරණ මත කටයුතු කිරිමට අපේක්ෂා කරන බව.	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර සභා වත්කම් නැවත පවරා ගත යුතුය.
(ආ)	එකතු වටිනාකම රු. 124,296,994 ක වත්කම් විෂයයන් 03 කට අදාළ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	නිවැරදි උපලේඛන ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව.	ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කළ යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 ජුනි 28 දින කළමනාකරණ කමිටු තීරණය මත ආදායම් ඉපයීමේ අරමුණින් උඩවිහාරගල නැරඹුම් මැදිරිය පිහිටි ස්ථානයේ ස්ථාපිත කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ මිලදී ගෙන තිබූ රු.120,000 ක දුරේක්ෂය බදු ගැනුම්කාර පාර්ශවය විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය වූ අතර දුරේක්ෂය මිලදී ගැනීමේ දී ලබාදුන් වගකීම් කාලයද අවසන් වී ඇති බව නිරීක්ෂණය විය. නැරඹුම් මැදිරිය පිහිටි භූමියේ වැසිකිළි පද්ධතිය පරිහරණයට නුසුදුසු ලෙස ඉතාම අපිරිසිදු තත්වයේ පවතින බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී තහවුරු විය.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් මෙම දුරේක්ෂය බදු දීමට කඩිනමින් කටයුතු කරන බව සහ වැසිකිළි පද්ධතියේ හඳුනාගත් අලුත්වැඩියාවන් මේ වන විට සභාව මගින් සිදු කරමින් පවතින බව.	නිශ්කාර්ය වත්කම් භාවිතයට ගත යුතු අතර වැසිකිළි පද්ධතියට අදාල බදුකරු සම්බන්ධයෙන් ගිවිසුමේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.5 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ඉඩම් අඬා පනතේ 27 වන වගන්තිය අනුව සභාව සතු ඉඩම් 24ක් හා සුසාන භූමි 34ක් පැවරුම් නියෝග යටතේ පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වලදී මෙම කරුණ පිළිබඳව සාකච්ඡා කර විසඳුමක් ලබා ගැනීමට අපේක්ෂා කරන බව.	සභාව සතු වත්කම්වල අයිතිය නිරවුල් කර ගත යුතුය.

3.6 මානව සම්පත් කළමණාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශිය සභාව සඳහා අනුමත කාර්ය මණ්ඩල වාර්තාව අනුව තනතුරු 04ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරීන් 09ක් සේවා නියුක්ත කොට තිබුණු අතර තනතුරු දෙකක් පුරප්පාඩුව පැවතුණි.	අනුමතව ඇති කාර්ය මණ්ඩල වාර්තාවට අනුව අනුමතව ඇති සේවකයින් ප්‍රමාණවත් නොවන බව.	අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරගත යුතුයි.
(ආ)	විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා මිය ගිය නිලධාරින් තිදෙනෙකුගෙන් අය නොවී පවතින රු.86,420ක හිඟ ණය ශේෂ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්ති ප්‍රකාරව ඇපකරුවන්ගෙන් අයකර නොතිබුණි.	අයකර ගැනීමට කටයුතු කරන බව.	ආයතන සංග්‍රහයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.

4 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කල ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 05 ක සියයට 72 සිට සියයට 85 දක්වාද, වියදම් විෂයයන් 05 ක සියයට 13 සිට සියයට 58 දක්වාද විචලනයන් පැවතුණි.	විගණන විමසුමෙන් පෙන්වා දී ඇති පරිදි අයවැය ලේඛණය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදා ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන බව.	අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය.

4.2 ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛනය හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේ දී ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදු කර ප්‍රමුඛතා ලැයිස්තුවකට අනුව සංවර්ධන ව්‍යාපෘති තෝරා නොගැනීම හේතුවෙන් 2024 වර්ෂය සඳහා හඳුනාගත් සංවර්ධන ව්‍යාපෘති 31 ක් අතරින් ව්‍යාපෘති 11 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.	මහජන ඉල්ලීම හා ප්‍රමුඛ අවශ්‍යතාවයන් අනුව හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බව.	අයවැය ලේඛනය, ක්රියාකාරී සැලැස්ම අනුව සංවර්ධන කටයුතු සිදු කළ යුතුය.

4.3 පාරිසරික ගැටළු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පොලිතීන් හා නොදිරන කසළ පිරිසිදු කර ප්‍රතිචක්‍රීයකරණය සඳහා ලබා දීමේ අරමුණින් රු.751,910ක් වැය කරමින් 2024 මාර්තු වන විට වැඩ අවසන් කර තිබුණු කසල කළමණාකරණ මධ්‍යස්ථානයේ ජල ටැංකි 02ක් 2025 පෙබරවාරි 24 විගණිත දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවති අතර පොලිතීන් හා නොදිරන අපද්‍රව්‍ය අවිධිමත් ආකාරයෙන් කසළ අංගනය තුළ බැහැර කරන බව නීරීක්ෂණය විය.	මෙම අඩුපාඩු මගහරවා ගැනීම සඳහා කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ජල ටැංකි 02 ක මේවන විට අලුත් වැඩියා කරමින් පවතින බව.	ඝණ අපද්‍රව්‍යය කළමනාකරණය විධිමත් කළ යුතුය.